## මිළ පාලන පනත

පහත සඳහන් උපලේඛනයේ දක්වෙන නියෝග මවිසින් අනුමත කරනු ලැබූ බව 173 වන අධිකාරය වන මිළ පාලන පනතේ 4 වැනි වගන්තියේ 7 වෙනි උපවගන්තියේ ප්‍රකාර මෙයින් දනුම් දෙමි.

ආර්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම හා ආහාර ඇමති.

1965 නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

| නියෝගයේ දිනය | නියෝගය නිකුත්කළ නිලධාරි | නියෝගය අදල ද්‍රව්‍ය | නියෝගය පලකරන ලද ගැසට් පත්‍රය |
|---|---|---|---|
| 1965. 8.31 | කළුතර දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිල පාලක | අතිරේක ආහාර ද්‍රව්‍ය මසූර් පරිප්පු | 1965. 9. 4 දින, අංක: 14,497 |
| 1965. 9. 8 | නුවරඑලිය දිස්ත්‍රික්කයේ, නියෝජ්‍ය ආහාර මිල පාලක | හරක්මස් පිකුදු සහ එළු මස් | 1965. 9.11 දින, අංක: 14,504 |
| එම | එම | අතිරේක ආහාර ද්‍රව්‍ය | එම |
| 1965. 9.11 | කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිල පාලක | එම | 1965. 9.14 දින, අංක: 14,506 |
| 1965. 9. 7 | පොලොන්නරුව දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර මිල පාලක | එම | එම |
| 1965. 9.15 | මොණරාගල දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර මිල පාලක | එම | 1965. 9.25 දින, අංක: 14,514 |
| 1965. 9.22 | මාතලේ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර මිල පාලක | එම | එම |
| 1965. 9.28 | මිළ පාලක ආහාර | එම | 1965. 9.29 දින, අංක: 14,516 |
| 1965. 9.21 | කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිල පාලක | එම | 1965. 9.30 දින, අංක: 14,517 |
| 1965. 9.29 | මාතලේ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර මිල පාලක | හරක්මස් | 1965.10. 5 දින, අංක: 14,525 |
| 1965.10. 8 | ගාලු දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිල පාලක | අතිරේක ආහාර ද්‍රව්‍ය | 1965.10.12 දින, අංක: 14,532 |

11–912

---

## ණය සහන් ආඥපනත

### නිවේදනයයි

(81 වැනි අධිකාරය වන) ණය සහන ආඥපනතේ 2 (1) දරණ වගන්තියෙන් ගරු අධිකරණ ඇමතිතුමා වෙත පවරා ඇති බලතල අනුව පහත නම් සඳහන් අය 1965 නොවැම්බර් මස 20 වෙනි දින සිට අවුරුදු තුනක කාලයකට ණය සහන මණ්ඩලයේ සභිකයන් ලෙස පත් කර ඇත.

එෆ්. කොන්රඩ් පෙරේරා මහතා.

ආර්. ඇල්. ද අල්විස් මහතා.

ටී. පී. ද ඇස්. මුණසිංහ මහතා.

ජේ. ඇන්. ඩේවිඩ් මහතා.

එෆ්. ඒ. අබයවර්ධන මහතා.

තවද, එෆ්. කොන්රඩ් පෙරේරා මහතා එම මණ්ඩලයේ සභාපති වශයෙන් පත්කර ඇත.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965.11.16 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දීය.

11–866

---

# මිළ පාලන දැන්වීම්

**සී. 402 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය** — **අතිරේක ආහාර ද්‍රව්‍ය**

## මිළ පාලන පනත

### නියෝගය

මිළ පාලක (ආහාර) තැන්පත් පින්නදූවගේ ආතර් සිල්වා වන මම (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මිල පාලක (ආහාර) වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1965 සැප්තැම්බර් 29 වෙනි දින අංක 14,516 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1965 සැප්තැම්බර් 28 වෙනි දින අංක සී. 401 දරණ ආහාර මිළ නියෝගය මේ දුන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) තවද, මීට යාකර ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් එක් එක් ද්‍රව්‍යය මෙරටට ගෙන්වන්නෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දලබර හොණ්ඩරයක්ද, තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, කොළඹ නගරයේ නාගරික සීමාවන් ඇතුලත විකිණිය හැකි වැඩිම මිළ මේ දුන් පටන් මේ උපලේඛනයේ 2 වෙනි 3 වෙනි හා 4 වෙනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(ආ) උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් ඉවත ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගණුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙනසේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා "රාත්තල" හෙවත් "රා" යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම්—

(අ) විකුණූ දිනය :

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) :

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල :

(ඈ) වෙළෙඳාමේ ස්වභාවය එනම් වෙළෙඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යනවග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(8) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යටකිසි දෙයක ඔතනු ලැබේ නම්, එහි මිළත්, උපලේඛනයේ 2 වෙනි 3 වෙනි හා 4 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

පී. ඒ. සිල්වා,
මිල පාලක (ආහාර).

1965 නොවැම්බර් 16 වෙනි දින අ.භා. 4.30 ට කොළඹදී
අත්සන් කරන ලදී.

## උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය | 4 වැනි තීරය |
|---|---|---|---|
| වර්ගය | මෙරටට ගෙන්වන්නෙකු විසින් දළබර හොණ්ඩර යක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩර යක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්ත ලක් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| ළූනු (රතුළූනු සහ වික්බෙලාපූර් හැර වෙනත් සියලුම) | 23 0 | 24 0 | 0 28 |
| කොත්තමල්ලි | 47 0 | 48 50 | 0 52 |
| පියළි නොකළ උළුඳු | 44 0 | 45 25 | 0 46 |
| මුංඇට | 39 50 | 40 75 | 0 41 |
| තෝර පරිප්පු | 47 75 | 49 0 | 0 50 |
| කඩල පරිප්පු | 46 25 | 47 50 | 0 48 |
| සියඹලා | 42 0 | 44 0 | 0 50 |
| අර්තාපල් | 24 0 | 25 0 | 0 27 |
| රතුළූනු | — | 24 0 | 0 28 |

**සැළකිය යුතුයි.**—(1) මෙ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන් ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නො හැකි ය.

(2) මෙරටට ගෙන්වන්නෙකු විසින් අය කරන මිළ හොණ්ඩර 10ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකුණන විට අය කරන මිළ විය යුතුය.

11-867

ලංකාවේ වැලිච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.